ලිහිල් කරන ලද වෙළෙඳ ප්‍රතිපත්තිය යටතේ වාණිජමය වශයෙන් ඵලදායී සහ කාර්යක්ෂම වනු පිණිස පුද්ගලික අංශය සමග ප්‍රබල ලෙස තරඟ කිරීමට රාජ්‍ය වාණිජ සංස්ථාවලින් බලාපොරොත්තු වෙන ලදී. බලාපොරොත්තු වූ පරිදි මෙම ආයතනයන්ගෙන් බොහොමයක්, වාණිජමය වශයෙන් ඵලදායී ඒකකයන් ලෙස ඔවුන්ගේ සම්ප්‍රදායික ව්‍යාපාරික කටයුතු වලින් අළුත් ව්‍යවහාරික ක්ෂේත්‍රයන් කරා යොමු වීමක් නව ආර්ථික පරිසරය සමග සිදු විය. අපනයන සම්බන්ධ කටයුතු වලට වැඩි සැළකිල්ලක් දක්වා ඇති අතර, දේශීයව නිෂ්පාදිත භාණ්ඩ මිළදී ගැනීමෙන් දේශීය නිෂ්පාදකයාට අත දීමටත් එමගින් ජාතික සංවර්ධනයට සහාය වීමටත් පරිශ්‍රමයක් දරණ ලදී. කෙසේ වෙතත්, මෙවැනි උත්සාහයන් දැරුවද මෙම වසරේදීත් සංස්ථා බොහොමයක් දිගටම අඩුපිරිවැටුමක් වාර්තා කිරීමට පුද්ගලික අංශය සමග වූ තරගය ප්‍රධාන වශයෙන් හේතු විය. තාවකාලික ඇස්තමේන්තු අනුව 1982 දී වෙළෙඳ සංස්ථා 11 හි පිරිවැටුම රුපියල් දශ ලක්ෂ 4,315 ක් වූ අතර, එය 1981 දී වූ රුපියල් දශලක්ෂ 4,640 සමග සැසඳීමේදී සියයට 7 ක පහත වැටීමක් දක්වයි.

රටෙහි අභ්‍යන්තර වෙළෙඳ කටයුතුවලදී සමූපකාර අංශයේ සහ ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුවේ කටයුතු නිදහස් වෙළෙඳ ක්‍රමය යටතේ විශාල වෙනස්වීම් වලට භාජනය විය. පාරිභෝගිකයින්ට තරඟකාරී මිළ යටතේ විවෘත වෙළෙඳපොළෙන් ලබාගත හැකි වූ භාණ්ඩ සුලභ වූ නිසා සමූපකාර අංශය කෙරෙහි බැඳී සිටීම තවදුරටත් අවශ්‍ය නොවුණි. මෙය, සමූපකාර අංශයේ සමස්ත පිරිවැටුම 1981 දී රුපියල් දශලක්ෂ 9,870 සිට 1982 දී රුපියල් දශලක්ෂ 8,320 දක්වා සියයට 16 කින් පහළ වැටීමෙන් පෙන්නුම් කෙරේ. නමුත්, පහළ ආදායම් මට්ටම් වල වැඩිපිරිසක්, සමූපකාර අංශය ආහාර මුද්දර ක්‍රමය යටතේ බෙදා හරින භාණ්ඩ වලින් වැඩි කොටසක් හසුරුවන නිසා තමන්ගේ එදිනෙදා අවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට සමූපකාර අංශය ප්‍රධාන මාධ්‍යයක් ලෙස සැළකීය. 1982 දී ද ආහාර මුද්දර යටතේ භාණ්ඩ බෙදාහැරීම තවදුරටත් පවත්වාගෙන යාමට සමූපකාරඅංශයට සිදුවිය. වෙළෙඳ පිරිවැටුම අඩුවූවද වෙළෙඳාමෙන් තමන් ලැබූ විකුණුම් අන්තරය 1981 දී සියයට 4 සිට 1982 දී සියයට 6 දක්වා වැඩිකර ගැනීමට මෙම අංශය සමත් වී ඇති බව මහ බැංකුවේ සමීක්ෂණයක් මත පදනම් වූ ඇස්තමේන්තු වලින් පෙනී යයි.

පුද්ගලික අංශය 1982 දී ද සහල්, පිටි, පාන් සහ සීනි වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාහැරීමේ දී ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කළේය. දේශීයව නිෂ්පාදිත සහල් සහ සීනි වෙළෙඳාමේ වැඩිම කොටසක් හැසිරවීමට මේ වසරේ ද පුද්ගලික අංශය සමත් විය. ආහාර කොමසාරිස්වරයාගේ දෙපාර්තමේන්තුව ආනයනය කළ සීනි ප්‍රමාණය සියයට 94 කින් පහළ වැටුණු අතර වී අලෙවි මණ්ඩලයෙන් සහල් මිළදී ගැනීම සියයට 87 කින් අඩු විය. ඒ සමගම වී අලෙවි මණ්ඩලය, නිෂ්පාදකයන්ගෙන් මිළදී ගත් වී ප්‍රමාණය සියයට 34 කින් අඩු විය. සහල් සහ සීනි වෙළෙඳාමේ දී පුද්ගලික අංශයේ කාර්යභාරය ඉන් විදහා දැක්වේ. කෙසේ වුවද පිටි බෙදාහැරීම සහ ප්‍රිමා ඇඹරුම් හලෙහි ඇඹරීමට තිරිඟු ඇට ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ විය.

## සංචාරක ව්‍යාපාරය

සංචාරක ව්‍යාපාරයේ ප්‍රධාන වෙළෙඳපොල වූ බටහිර රටවල ආර්ථිකයන් වර්ධනය නොවී එකතැන පැවතීම ලෝක සංචාරක ව්‍යාපාරයට අහිතකර ලෙස බලපා ඇතත්, 1982 වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, විදේශ විනිමය ඉපයීමේ වැදගත්කම අනුව, සිව්වන ස්ථානයට පත්ව ඇත. රැකියා නියුක්තිය වර්ධන කිරීමට ද මෙම කර්මාන්තය සමත්ව ඇත.

1982 වසර තුළදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව 407,230 ක් වූ අතර මෙය පසුගිය වසරට වඩා සියයට 10 ක පමණ වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. 1981 වසර තුළදී දක්නට ලැබූ ප්‍රවනතාවයට අනුව මෙම වසරේද සංචාරක පැමිණීම් වර්ධන අනුපාතයේ තවදුරටත් පහත බැසීමක් දක්නට ලැබිනි. පසුගිය වසරේ සංඛ්‍යාව හා සසඳන විට නැව්ගත මගීන් ඇතුළුව පැය 24 කට අඩු කලකට රට තුළ රැඳෙන සංචාරකයන්ගේ (සාංක්‍රමණිකයන් හැර) සංඛ්‍යාව පසුගිය වර්ෂයේ ප්‍රමාණයට වඩා සියයට 14 ක පහත බැසීමක් පිළිබිඹු කරමින් 1982 වර්ෂයේදී 6,632 ක් විය.

## 1.38 සංඛ්‍යා සටහන

### සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන 1981—1982

| ශීර්ෂය | 1981 | 1980 ට වඩා ප්‍රතිශත වෙනස | 1982 | 1981 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් .. | 370,742 | 15.2 | 407,230 | 9.8 |
| 2. පැය 24 කට අඩු කලකට රට තුළ රැඳෙන විදේශික මගීන්ගේ පැමිණීම් .. | 7,737 | – 10.4 | 6,632 | – 14.3 |
| 3. සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) .. | 3,907 | 10.1 | 4,064 | 4.0 |
| 4. සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4.1 රුපියල් දශ ලක්ෂ .. | 2,546.5 | 39.1 | 3,050.5* | 19.8 |
| 4.2 එ.ජ. ඩොලර් දශ ලක්ෂ .. | 132.4 | 19.6 | 146.6 | 10.7 |
| 4.3 වි.ගැ.හි. ඒකක දශ ලක්ෂ .. | 112.3 | 32.0 | 132.8 | 18.2 |
| 5. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5.1 විනෝදය .. | 331,638 | 13.6 | 361,188 | 8.9 |
| 5.2 ව්‍යාපාරික කටයුතු .. | 23,540 | 21.8 | 27,484 | 16.7 |
| 6. කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6.1 බටහිර යුරෝපය .. | 245,785 | 15.1 | 232,290 | – 5.5 |
| 6.2 ආසියාව .. | 88,744 | 18.8 | 135,088 | 52.2 |
| 6.3 උතුරු ඇමෙරිකාව .. | 13,947 | 8.3 | 15,528 | 11.3 |
| 7. මුළු සේවා නියුක්තිය .. | 55,255 | 15.3 | 60,000* | 8.6 |
| 7.1 සෘජු .. | 23,023 | 15.8 | 25,000* | 8.6 |
| 7.2 වක්‍ර .. | 32,232 | 15.0 | 35,000* | 8.6 |

* ඇස්තමේන්තු කරන ලද සංඛ්‍යා.

මූලය: ලංකා සංචාරක මණ්ඩලය.

1982 දී සංචාරකයන් රට තුළ ගත කළ මුළු රාත්‍රී දින ගණන 4,064,155 ක් විය. මෙය පසුගිය වසරට වඩා සියයට 4 ක වැඩිවීමක් පෙන්වීය. සංචාරක ව්‍යාපාරයේ පැමිණීම් පිළිබඳ ප්‍රමාණය දැක්වීමට වඩා යෝග්‍ය දර්ශකයක් වූ සංචාරකයන් රට තුළ ගත කරන දින ගණන වර්ධනය වී ඇත්තේ, මෙම වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයට වඩා අඩු වේගයකිනි. සංචාරකයකු දිවයිනේ ගත කරන සාමාන්‍ය දින ගණන 1979 දී වාර්තා වූ 11.1 ක වූ ඉහළ ප්‍රමාණයකින් පසුව ක්‍රමයෙන් අඩුවෙමින් 1982 දී 10.0 දක්වා පහත වැටුණි.

මෙතෙක් ප්‍රධාන වෙළෙඳපොල වූ බටහිර යුරෝපය, මෙම වසරේදී ද, වෙළෙඳපොලේ නායකත්වය දිගටම පවත්වා ගනු ලැබීය. මෙම වසරේ දී බටහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයන් ප්‍රමාණය, මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 57 ක් විය. මෙය පසුගිය වසරේ වාර්තා වූ සියයට 66 ක ප්‍රමාණය හා සැසඳේ. පසුගිය දශකය තුළ ප්‍රථම වරට, 1982 දී බටහිර යුරෝපීය රටවලින් පැමිණි සංචාරකයන් ප්‍රමාණය සියයට 5.5 කින් පහත වැටුණි. ආසියානු වෙළෙඳපොල දෙවන ප්‍රධාන වෙළෙඳපොල ලෙස සිය දයකත්වය 1981 දී වූ සියයට 24 ක ප්‍රමාණයක සිට 1982 දී මුළු පැමිණීම්වලින් සියයට 33 දක්වා වර්ධනය කරලීමට සමත් විය. මෙය ප්‍රධාන වශයෙන්ම ඉන්දියානු ජාතිකයන්ගේ පැමිණීම්වල වූ වැඩිවීමේ ප්‍රතිඵලයකි. ඕස්ට්‍රලේෂියානු රටවලින් සංචාරකයන් පැමිණීම 1981 දී මුළු වෙළෙඳපොලෙන් සියයට 2.6 සිට 1982 දී සියයට 3.1 දක්වා වර්ධනය වූ අතර උතුරු ඇමෙරිකාවෙහි වෙළෙඳපොල දයකත්වය පසුගිය වසරේ මෙන් මුළු සංඛ්‍යාවෙන් සියයට 4 ක ප්‍රමාණයක් විය.

1982 දී සංචාරක කර්මාන්තයේ ඇස්තමේන්තු කළ දළ ඉපැයීම් රුපියල් දශලක්ෂ 3,050 ක් වූ අතර එය පසුගිය වසරට වඩා සියයට 20 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙය විගැහි ඒකකවලින් සියයට 18 ක වර්ධනයක් පිළිබිඹු කරමින් දශ ලක්ෂ 133 ක් විය. පසුගිය වසර

කීපය තුළ සංචාරක කර්මාන්තයේ දළ ඉපැයීම්වල වාර්තාගත වූ වර්ධන වේගය නොකඩවා ලබා ගැනීමට 1982 දී අපොහොසත් වූ බව පෙනේ. තීරුබදු රහිත සාප්පු සංකීර්ණය ඇතුලු සංචාරක සාප්පුවලින් 1982 දී මුලු දළ ඉපයීම්වලින් සියයට 22 ක් ලැබුණි. මෙය පසුගිය වර්ෂයේ සංචාරක සාප්පුවලින් ලැබුණු, දළ ඉපැයීම්වලින් සියයට 7 ක ප්‍රමාණය හා සැසඳේ. මෙම වැඩිවීමට මූලික වශයෙන් හේතු වූයේ තීරු බදු රහිත සාප්පු සංකීර්ණය මුළු සංචාරක සාප්පුවලින් ලැබූ දළ ඉපැයීම්වලින් සියයට 76 ක් හෙවත් රුපියල් දශ ලක්ෂ 496 ක දයකත්වයක් ලැබීමය. 1981 වසර තුළදී, හෝටල් හා චාරිකා නියෝජිතයන්ගේ දළ ලැබීම්වල දයකත්වයවූ පිළිවෙලින් සියයට 22 ක හා සියයට 33 ක ප්‍රමාණයන් හා සළකා බලන විට මෙම වර්ෂයේ ඒවා පිළිවෙලින් සියයට 17 ක් සහ සියයට 21 ක් ලෙස පහත බැස ඇත.

සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම්වල ඇති වැදගත්කම ගෙවුම් තුලන දත්තයන්ගෙන් මැනිය හැකිය. 1979 වසරේ සේවා ගිණුමේ ආදයමින් සියයට 35 ක් වූ සංචාරක කර්මාන්තයේ දයකත්වය 1982 දී සියයට 34 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. සංචාරක ව්‍යාපාරයෙන් ලැබුණු විදේශ විනිමය ඉපැයීම් 1981 වර්ෂයේ දී රටේ මුළු විනිමය ඉපැයීමේ වැදගත්කම අනුව ලැබූ පස්වන ස්ථානයේ සිට 1982 දී රබර් අපනයන ආදයම් ඉක්මවා යමින් වැදගත්කම අනුව සිව්වන ස්ථානයට වර්ධනය වී ඇත.

සංචාරක ව්‍යාපාරය මගින් ඍජු ලෙස එම කර්මාන්තය තුළ ද, වක්‍ර ලෙස අනිකුත් සේවා අංශයෙහි ද පුළුල් වශයෙන් රැකියා අවස්ථාවන් ලබාදේ. 1982 දී සංචාරක කර්මාන්තයෙහි ඍජුව නියැලුනු සංඛ්‍යාව 25,000 ක් වූ අතර, එය 1981 වර්ෂයට වඩා සියයට 8 ක වර්ධනයක් පෙන්වා ඇත. 1982 අවසානය වන විට සංචාරක කටයුතුවලින් වක්‍රව උත්පාදනය කළ මුළු රැකියා ගණන 35,000 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1982 අවසානය වන විට සංචාරක කර්මාන්තයෙහි නියුතු මුළු සංඛ්‍යාව 60,000 ක් විය. මෙය මෙම අංශය තුළ සෑම සංචාරකයන් 7 දෙනකුගේ පැමිණීම එක රැකියාව බැගින් ඇති කිරීමට ඉවහල් වී ඇති බව හඟවයි.

ශ්‍රේණිගත නවාතැන් අංශයේ ඒකක ගණන 1981 දී 115 සිට 1982 දී 123 දක්වා වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මුළු කාමර ගණන 6,891 සිට 7,539 දක්වා ඉහළ නැඟුණි. මේ අතර, ශ්‍රේණිගත නවාතැන් අංශයේ වාර්ෂික කාමර උපයෝගිතා අනුපාතය 1980 දී වාර්තාගත ඉහළම ප්‍රමාණය වූ සියයට 57 සිට ක්‍රමයෙන් 1982 දී සියයට 47.8 දක්වා පහත වැටුණි. වාර්ෂිකව, රට තුළට පැමිණෙන සංචාරකයන්ගේ ගණන වැඩි වුවත්, ශ්‍රේණිගත නවාතැන් අංශයේ වාර්ෂික උපයෝගිතා අනුපාතය පහත වැටීමෙන් පෙනී යන්නේ සංචාරකයන් නවාතැන් පහසුකම් සඳහා ශ්‍රේණිගත අංශයෙන් බැහැර ස්ථාන කරා ඇදී යාම වැඩිවී ඇති බවය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, බටහිර යුරෝපීය වෙළෙඳපොල මත අධික ලෙස රඳා පැවැත්ම, එම කර්මාන්තයෙහි ඇති මූලික ව්‍යුහාත්මක දුර්වලතාවයකි. එබැවින් මෙම කලාපයෙන් පැමිණෙන සංචාරකයන්ගේ සංඛ්‍යාවෙහි ඇති විය හැකි වෙනස්කම්වලින් සංචාරක කර්මාන්තයට එල්ල විය හැකි අහිතකර විපාක වැලැක්වීම සඳහා මෙරටට පැමිණෙන සංචාරකයන්ගේ මූලයන් විවිධාංගීකරණයක් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුව ඇත. තවත් වැදගත් කරුණක් වන්නේ සංචාරකයන් ශ්‍රේණිගත නවාතැන් වෙනුවට අඩු වියදම් නවාතැන්වල නවාතැන් ගැනීම වැඩිවීමය. මෙය මෙම අංශයේ වූ මිල ඉහළයාම නිසා සිදුවූවා විය හැකිය. දැනට හෝටල් මත පනවා ඇති බදු සහ ඉහළ ගොස් ඇති විදුලි සහ ජල ගාස්තු මෙම මිල ඉහලයාමට සම්බන්ධ විය හැකිය.

## ගෙවුම් තුලනය

රුපියල් දශලක්ෂ 11,793 (විගැහි දශලක්ෂ 515) ක් වූ ශ්‍රී ලංකාවේ 1982 ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුම් හිඟය වාර්තා ගතවී ඇති වැඩිම හිඟයයි. සැසඳීමක් වශයෙන් ගතහොත් 1981 දී එම හිඟය රුපියල් දශලක්ෂ 8,342 (විගැහි දශලක්ෂ 375) ක් විය. ජංගම ගිණුම් හිඟය දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්, 1981 සියයට 11 සිට 1982 සියයට 13 දක්වා වැඩි විය. ජංගම ගිණුම් හිඟය සියයට 26 කින් හා දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් වශයෙන් එහි කොටස ප්‍රතිශත ඒකක 4 කින් අඩු වූ, 1981 විකාශනය හා සසඳන විට, මෙම වෙනස්වීම් එතරම් සතුටුදයක නැත. විශේෂයෙන්ම, විදේශීය ණය ගැනීම් වෙනුවෙන් වූ පොළී ගෙවීම්